# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
## දැන්වීමයි

පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. <u>තනතුර : නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරු (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ දෙවන මට්ටම) - SLM 2</u>**

**(අ) යෝග්‍යතාවය**
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

**සමඟ**

**පළපුරුද්ද**
ශ්‍රී ලංකා යුද හමුදාවේ කර්නල්වරයෙකු/ ශ්‍රී ලංකා නාවික හමුදාවේ කපිතාන්වරයෙකු/ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කණ්ඩායම් කපිතාන්වරයෙකු/ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු ලෙස වසර පහ (05)ක ක්‍රියාකාරී සේවය

**(ආ) වැටුප**

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : **3 : 2 SLM 2** |
| ආරම්භක වැටුප | : රු. 120,040/= |
| වාර්ෂික වැටුප් වර්ධකය | : රු. 2,155/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 216,500/= පමණ වේ

**ප්‍රතිලාභ : තෝරාගත් අපේක්ෂකයා වෙනුවෙන් ඉන්ධන, වෛද්‍ය, දුරකථන / ජංගම දුරකථන සහ අනෙකුත් අමතර ප්‍රතිලාභ සහිත අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන වාහනයක් ලබා දේ.**

**02. <u>තනතුර : නාවික නියමු (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තෙවන මට්ටම) – SLM 3</u>**

**(අ) යෝග්‍යතාවය**
ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ නෞකාපති (සීමා රහිත) ප්‍රවීණතා සහතිකය හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන ප්‍රවීණතා සහතිකයක්

**සමඟ**

**පළපුරුද්ද**
විදේශීය වෙළඳ නෞකාවක යාත්‍රාපතිවරයෙකු ලෙස වසර එක (01)ක මුහුදු ගමන් පළපුරුද්ද

**(ආ) වැටුප**

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : **3 : 3 (SLM 3)** |
| ආරම්භක වැටුප | : රු. 109,215/= |
| වාර්ෂික වැටුප් වර්ධකය | : රු. 1,945/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 204,500/= පමණ වේ

**03. <u>තනතුර : සහකාර නීති නිලධාරි (මධ්‍යම කළමනාකරණ දෙවන මට්ටම) – MLM 2</u>**

**(අ) යෝග්‍යතාවය**
පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් නීති උපාධියක් සහිත නීතිඥයෙකු වීම

**සමඟ**

**පළපුරුද්ද**
රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක නීතිඥයෙකු වශයෙන් වසර පහ (05) ක පළපුරුද්ද.

02 පිටුවට ..........

**(ආ)** වැටුප

වැටුප් කාණ්ඩය : 4 : 2 MLM 2

ආරම්භක වැටුප : රු. 82,505/=

වාර්ෂික වැටුප් වර්ධකය : රු. 1,585/=

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 175,000/= පමණ වේ

**සටහන :** ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ මාධයෙන් ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍රයක් ලබා තිබීම.

**වයස් සීමාව : වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි)**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාශයක සහ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), මානව සම්පත් කොට්ඨාශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙන සේ 2026-06-30 වන දිනට පෙර <u>ලියාපදිංචි තැපෑලෙන්</u> එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

<u>**අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**</u>

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**